**ශිර්ෂය 229 - නීතිපති දෙපාර්තමේන්තුව**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

නීතිපති දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇතවංචා සහ . වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සඳහන් කර තිබූ පෙර වර්ෂයට අදාල අනුරූපී ශේෂයන් හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල එම විෂයයන්ට අදාලව පැවති ශේෂයන් අතර එකතුව රු.58,500,819 ක වෙනසක් විය. ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමක් හෝ සිදු කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ සංස්ථා අංශය විසින් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාල නෛතික ගාස්තු සඳහා බිල් කල ආදායම වූ රු.125,705,333 ක මුදලින් රු.52,331,183 ක් අය කරගෙන තිබීම නිසා හිඟහිටි ආදායම රු.73,374,150 ක් විය. එහෙත් මූල්‍ය ප්‍රකාශනවල හිඟහිටි ආදායම ලෙස රු.68,693,091 ක් දක්වා තිබීම හේතුවෙන් හිඟ ආදායමේ රු.4,681,059 ක වෙනසක් නිරීක්ෂණය විය. | අයවීමට ඇති ආදායම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | 2019 දෙසැම්බර් 31 දින සංස්ථා අංශයට ලැබී තිබූ චෙක්පත් 2020 ජනවාරි මස මුල් සතිය තුල ගිණුම් අංශයට ලැබීම හේතුවෙන් සංස්ථා අංශයේ 2019 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කරන ලද ඉහත වටිනාකමකින් යුතු චෙක්පත් නීතිපතිතුමාගේ ගිණුමට 2020 වර්ෂයේ ජනවාරි මස බැර වී තිබුණි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශයට (ඒසීඒ 2 (II)) අනුව සමාලෝචිත වර්ෂය තුල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වැය විෂයය 2104 යටතේ දරා තිබුණු රු.416,857,292 ක වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ සඳහන් කර නොතිබුණි. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දරනු ලබන මුළු වියදම කෙරීගෙන යන වැඩ යටතේ සඳහන් කර වර්ෂ අවසානයට නොනිම් වැඩ ලෙස දැක්විය යුතු වේ. | 2019 වර්ෂය තුල කරන ලද ගෙවීම්ද ප්‍රමාද දෝෂයකින් 2019 වර්ෂයේ ආරම්භක ශේෂයට ඇතුලත් වී ඇත. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 571 | වටිනාකම රු.460,457 ක් වූ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි 571 (1) (2)(3) ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 2016 වර්ෂයේ ලඝුලේඛිකාවන් බඳවා ගැනීම සඳහා පැවැත් වූ විභාග සඳහා ඉල්ලුම්කරුවන් ගෙවන ලද විභාග ගාස්තු තැන්පත් ගිණුමේ රඳවා තබා ඇත. |
| ii. මුදල් රෙගුලාසි 880 (I), 2011 ජනවාරි 11 දිනැති අංක 01/2011 සහ 2014 මැයි 07 දිනැති අංක 01/2011 (I) දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 අනුව රජයේ මුදල් හා මුද්දර භාරව කටයුතු කරන, වවුචර් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන්ගෙන් ඇප ආඥා පනතට අනුකූලව ඇප ලබාගත යුතුවේ. | ඇප තැබීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය | විධි විධාන ප්‍රකාරව වැඩ සඳහා වූ යම් කොන්ත්‍රාත්තුවක් සඳහා පිළිගත හැකි බැඳුම්කරයක් මත සියයට විස්සක් දක්වා උපරිමයකට යටත්ව අත්තිකාරම් මුදලක් ගෙවිය හැක. එසේ වුවද, අළුත්වැඩියා කටයුත්තක් සඳහා ඉදිරිපත් කර තිබූ රු.3,187,460 ක ඉදිකිරීම් ඇස්තමේන්තුවක් සඳහා රු.1,000,000 ක් හෙවත් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | යුධ හමුදා 06 වන ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවට පවරා ඇති නිසා අත්තිකාරම් ඇප සුරැකුමක් නොමැතිව අත්තිකාරම් ගෙවීම් කර ඇත. |

සියයට 31.37 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර ඒ සඳහා අත්තිකාරම් බැඳුම්කරයක් ද ලබා ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 2.1 ආදායම් කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) <u>ආදායම් ඇස්තමේන්තු කිරීම</u>** | | |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තු ගත ආදායම රු. 62,000,000 ක් වුවද බිල්කල ආදායම රු.125,705,333 ක් වීම නිසා ඇස්තමේන්තුව ඉක්ම වූ බිල් කිරීම් රු. 63,705,333 ක් විය. | ආදායම් ගණන්දීමේ නිලධාරින් ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ කාර්ය අඛණ්ඩව සමලෝචනය කිරීම, විශ්ලේෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම කළයුතු වේ. | නෛතික සේවාවන් සැපයීම වැඩි කිරීම නිසා ආදායම් වැඩි වී ඇත. |
| **(ආ) <u>හිඟ ආදායම් අය කර ගැනීම</u>** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත හිඟහිටි ආදායම රු.269,691,737 ක් වූ අතර ඉන් වර්ෂ 3 ඉක්ම වූ රු.173,944,484 ක් විය. | රජයට අය විය යුතුව තිබෙන ආදායම් කාල පමාවකින් තොරව අය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හිඟ ආදායම් එකතු කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **(ඇ) <u>ආදායම් ගිණුම් ගත කිරීමේ කාල පමාව</u>** | | |
| මුදල් රෙගුලාසි 177 (I) ප්‍රකාරව දෛනිකව රැස්කරනු ලබන ආදායම් කාල ප්‍රමාදයකින් තොරව රජයේ ආදායමට ගිණුම්ගත කළ යුතු වුවද, නීතිපති දෙපාර්තමේන්තුවේ දෛනිකව රැස්කරනු ලබන ආදායම රජයේ ආදායමට ගිණුම් ගත කිරීම දින 07 ත් 10 ත් අතර කාල පමාවකින් පසුව සිදු කර තිබුණි. | මුදල් රෙගුලාසි 177 (1) ප්‍රකාරව දෛනිකව රැස්කරනු ලබන ආදායම කාල ප්‍රමාදයකික් තොරව රජයේ ආදායමට ගිණුම් ගත කල යුතු වේ. | විශාල චෙක්පත් ප්‍රමාණයක් එකවර ලැබීමේ දී හා නිවාඩු දිනයන් ද සැලකිල්ලට ගත් කල දින කිහිපයක කාල ප්‍රමාදයක් සිදු වී ඇති අතර ඉදිරියේ දී එම තත්ත්වය නිවැරදි කර ගනිමින් එවැනි කාල ප්‍රමාදයකින් තොරව චෙක්පත් බැංකු ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආර්ථික ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛ කිහිපයක් මඟින් රජයේ නිලධාරීන්ගේ විදේශ සංචාර නැවත දැනුම් දෙන තුරු අත්හිටු වන ලෙසත් විදේශ සංචාර වියදම් හැකිතාක් අවම කරන ලෙසත් සහ අමතර ප්‍රතිපාදන ඉල්ලීම් නොකරන ලෙසත් දන්වා තිබුණි. විදේශිය ගමන් වියදම් සඳහා ප්‍රතිපාදන සලසා තිබූ රු.27,000,000 ක ශුද්ධ ප්‍රතිපාදන මුදලින් 2019 සැප්තැම්බර් මස වන විට රු.21,097 ක ශේෂයක් පමණක් ඉතිරිව තිබුණි. එහෙත් 2019 ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වලදී සිදු කර තිබූ විදේශ සංචාර සඳහා අවස්ථා 06 ක දී වියදම් කර තිබූ රු.1,360,074 ක මුදල විදේශ ගමන් සඳහා සම්මත (229-1-1-0-1102) වැය විෂයයට හර නොකර 229-1 – 1 – 3 - 1409 (වෙනත්) වැය විෂයයට හර කර වියදම් දරා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලීම් කල ද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණ නමුත් ඉහත සංචාරයන්ගේ අත්‍යාවශ්‍යතාවය නිසා විගණන විමසුමේ සඳහන් පරිදි කටයුතු කිරීමට සිදු වී තිබුණි. පසුව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන සලසා ගෙන අදාල ගෙවීම් නිවැරදි කර ඇත. |
| (ආ) | 2019 අප්‍රේල් 08 දිනැති අංක 03/2019, 2019 ජූනි 17 දිනැති අංක 04/2019 සහ 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 2019/05 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ මඟින් ඇස්තමේන්තුගත රජයේ ආදායම් හා දැරිය හැකිවන වියදම් සීමාවන් පිළිබඳ දැඩිලෙස අවධානය යොමු කළ යුතු බව අවධාරණය කර තිබුණි. එහෙත් 2019 දෙසැම්බර් 31 දින රු.10,700,000 ක මුදලක් අංක 229-01-01-03-1409 දරන වැය විෂයයට හර කරමින් වියදම් විස්තරයක් ඉදිරිපත් කිරීමකින් තොරව මුදල් පොතෙන් ඉවත් කර තිබූ අතර එම මුදල දින 123 ක් රඳවා තබා ගැනීමෙන් අනතුරුව 2020 මැයි 02 දින පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විචක්ෂණශිලී භාවයෙන් වියදම් කළමණාකරණය කල යුතු වේ. | 1995 සැප්තැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව නෛතික සේවා සැපයීම වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු වලින් ඇස්තමේන්තු කල වියදම ඉක්මවා ලැබෙන ආදායම ආපසු ලබාගෙන තිබේ. |

**2.3** බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන III යටතේ) එක් ආයතනයක් වෙත ගෙවිය යුතු රු.2,117,582 ක් භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන බැරකම් ලේඛනයට අනුව වියදම් විෂයන් 02 ක් සඳහා අවස්ථා 11 ක් යටතේ වූ රු.85,803,631 ක බැරකම් භාණ්ඩාගාරයට වාර්තා නොකිරීම නිසා දෙපාර්තමේන්තු බැරකම් පිළිබඳ ශේෂයන් සහ භාණ්ඩාගාරය විසින් තහවුරු කරන ලද බැරකම් ශේෂයන් සැසඳී නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අදාල වන සියළු බැරකම් පෙන්විය යුතු වේ. | නීති නිලධාරීන් 100 දෙනෙකු සඳහා නිල වාහන සඳහා සේවා පහසුකම් පවත්වාගෙන යාම සඳහා වෙන් කර දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් සිගාස් වැඩ සටහන මඟින් බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කිරීමට නොහැකි විය. අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගැනීමේදී සීමාවන් ඉක්මවා ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව දෙපාර්තමේන්තුවක් විසින් වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා ප්‍රතිපාදන ඇත්නම් මිස වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතුය. එසේම ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන මුදල් සීමාව නොඉක්ම විය යුතුය. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුවේ එක් වැය විෂයයකට අදාලව ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා රු.963,058 ක බැරකම් වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා ප්‍රතිපාදන ඇත්නම් මිස දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා වන කිසිම වියදමකට නොබැඳී සිටිය යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

## 2.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැඩ තහනම් කිරීමකට ලක් ව ඇති නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.211,560 ක් සහ සේවය හැර ගිය නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු.1,931,644 ක මුදලක් වසර 05 වැඩි කාලයක සිට අය නොවී හිඟ හිටි ණය ශේෂ වශයෙන් පැවතුණි. | රජයේ නිලධාරීන්ට ලබා දී තිබෙන ණය අත්තිකාරම් මුදල් කාල ප්‍රමාදයකින් තොරව අය කර ගැනීමට කටයුතු කල යුතු වේ. | හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා 2019 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර පසුව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රජය, රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියළුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ දී සුවිශේෂී කාර්යන් සඳහා දායක වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලට අදාල මුළු කාර්ය මණ්ඩලය 257 ක් එනම් සියයට 51 ක පුරප්පාඩු පැවතුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කලයුතු වීම. | එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් සිටින බව දන්වමි. |